**වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2015 මාර්තු 11 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනය 2014 පෙබරවාරි 28 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.97,920 ක් වූ ඉන්ධන ලීටර් 720 ක ඉතිරි තොගයේ පිරිවැය ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන ස්වරූපයේ වාහන උපාංග සවි කිරීමේ වියදම් රු.200,420 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනයෙහි වූ ගිණුම් විෂයයන් දෙකක එකතුව හා ඒවාට අදාල උපලේඛනවල එකතුව අතර රු.750,561 ක වෙනසක් විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම් පිළිවෙලින් රු.20,197,189 ක් හා රු.18,566,745 ක් විය. එයින් වර්ෂයකට වඩා වැඩි ලැබිය යුතු ශේෂවල වටිනාකම රු.4,123,901 ක් වූ අතර වර්ෂ 3 ක් ඉක්මවූ ණයහිමියෝ රු.181,985 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 07 කට අදාලව එකතුව රු. 76,282,827 ක් වූ වත්කම් හා වගකීම් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකිව තිබුණි.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) හා (ඊ) සහ 158 වගන්ති ප්‍රකාරව පිළිවෙලින් සභාවට ලැබිය යුතු ආදායම් විධිමත් පරිදි අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණු අතර, වරිපනම් හා අක්කර බදු නොගෙවා පැහැර හරින්නන්ගේ චංචල දේපල තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 මැයි 13 දිනැති අංක 5/3 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව කල් ඉකුත් වූ ආපසු ගෙවිය යුතු තැන්පතුවල තිබූ රු.2,012,477 ක් වටිනාකම ආදායමට ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,933,782 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,932,201 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුළ පිළිවෙලින් රු.31,185,147 ක් හා රු.22,025,989 ක් වූ මූලධන ආධාර හා රු.48,132,359 ක් හා රු.20,576,094 ක් වූ මූලධන වියදම් ගණන් බැලීමෙන් පසු එකී ඌනතාවය පිළිවෙලින් රු.14,013,430 ක් සහ රු.482,306 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.13,531,124 ක පසුබෑමක් දක්නට ලැබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

---------------------

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

-------------------------------------

**ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000‘ | රු. 000‘ | රු. 000‘ |
| (අ) | වරිපනම් හා බදු | 710 | 692 | 1,133 |
| (ආ) | කුලී | 2,727 | 2,542 | 431 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 214 | 214 | - |
| (ඈ) | සේවා සඳහා ගාස්තු | 575 | 575 | - |
| (ඉ) | වරෙන්තු හා දඩ | 2,386 | 1,059 | 2,106 |
| (ඊ) | වෙනත් ආදායම් | 2,570 | 1,507 | 3,926 |

### 2.2.2 වරිපනම් බදු හා අනෙකුත් බදු

-------------------------------

වරිපනම් බදු, අක්කර බදු හා ජල බදුවල 2014 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.1,133,072 ක් වූ අතර, වර්ෂ 05 කට වැඩි කාලයක් ඉක්මවා තිබූ වරිපනම් හා අක්කර බදුවල හිඟය, එම බදුවලින් සියයට 42 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. එසේම 2014 ජල බදු අයවීමේ ප්‍රගතියද දුර්වල තත්ත්වයක පැවතුණි.

### 2.2.3 බදු කුලී, කඩ කුලී බලපත්‍ර ගාස්තු හා සේවා සඳහා ගාස්තු

------------------------------------------------------------

හිඟ බදු කුලී මුදල රු.10,250 ක් වූ අතර, එයින් රු.2,750 ක් අවුරුදු 1 ත් අවුරුදු 3 ත් අතර කාල පරාසයක සිට ඉදිරියට ගෙන එමින් පැවති අතර, රු.7,500 ක් අවුරුදු 3 ත් අවුරුදු 5 ත් අතර කාල පරාසයක සිට හිඟව පැවතුණි. හිඟ කඩ කුලී රු.420,943 ක් වූ අතර, රු.67,019 ක් අවුරුදු 1 ත් 3 ත් අතර කාල පරාසයක සිට හිඟව පැවතුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

මහේස්ත්‍රාත් අධිකරණයකින් වයඹ පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා තිබූ රු.2,106,413 ක උසාවි දඩ ගිණුම්ගත කර නොතිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලේකම් වෙතින් ලැබිය යුතු මුද්දර ගාස්තුද ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභාවේ විධායක ශ්‍රේණියේ තනතුරක සහ ද්විතියික ශ්‍රේණියේ තනතුරු 07 ක පුරප්පාඩු පැවති අතර, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක අතිරික්තයක් විය. කාර්ය මණ්ඩලයේ අනුමත නොවූ තනතුරු සඳහා අනියම් පදනම මත සේවකයින් 07 දෙනෙකු බඳවාගෙන තිබුණි.

### 3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සභාව සතු රු.676,000 ක් වටිනා වත්කම් විෂයයන් 10 ක් වර්ෂ කිහිපයක් තිස්සේ නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

### 3.3 හඳුනාගත් අලාභ

වනාතවිල්ලුව සහ කරතිව් මහජන පුස්තකාලවල රු.233,342 ක් වටිනා පුස්තකාල පොත් 1516 ක් අස්ථානගත වී තිබූ අතර, එම වටිනාකම වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4. අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කිරීම රු.78,425,000 ක් වූ අතර, තථ්‍ය ප්‍රාග්ධන වියදම රු.48,132,000 ක් වුයෙන්, එහි විචලනය සියයට 38 කට ආසන්න අගයක් ගෙන තිබුණි.

## 4. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය